# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 11 දරන
# රජයේ සේවකයන්ගේ (වගකීම්) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 11 දරන රජයේ සේවකයන්ගේ (වගකීම්) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 63/89

### රජයේ සේවකයන්ගේ (වගකීම්) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 11 දරන රජයේ සේවකයන්ගේ (වගකීම්) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** රජයේ සේවකයන්ගේ (වගකීම්) ආඥාපනතේ 2 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 103 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"5අ. තමා රජයේ සේවකයකු බව ණයට දෙන්නා වෙත හෙළිදරව් කිරීමට අපොහොසත් වූ හෝ ඔහුට විරුද්ධව ක්‍රියාවේ යෙදවීමට අපේක්ෂා කරන වගකීම් ගිවිසුමට එළඹීමට පෙරාතුව තමාගේ රැකියාව හෝ සේවා නියුක්තිය පිළිබඳව ණයට දෙන්නා විසින් ඔහුගෙන් කරන ලද කිසියම් විමසීමක දී තමාගේ රැකියාව හෝ සේවා නියුක්තිය රජයේ සේවකයකුගේ රැකියාවක් හෝ සේවා නියුක්තියක් නොවන බව ප්‍රකාශ කර ඇත්තා වූ හෝ රජයේ සේවකයකු විසින් ගිවිසුමකට එළඹෙන ලද කිසියම් වගකීමක් සම්බන්ධයෙන් මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.